# ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 07 (LKAS 07)

## **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** (cash flow statements)

<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් යනු කුමක් ද?</u>

යම් නිශ්චිත කාලච්ඡේදයක් තුළ ව්‍යාපාර ඒකකයක මුදල් හා මුදල් සමාන දෑ උත්පාදනය වී ඇති ආකාරයත් ඒවා යෙදවී ඇති ආකාරයත් දැක්වෙන ප්‍රකාශය ලෙස හැඳින්විය හැකිය.

**<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ ප්‍රයෝජන</u>**

1. ව්‍යාපාරයක මුදල් හා මුදල් සමාන දෑ ජනනය කිරීමේ හැකියාව තක්සේරු කළ හැකි වීම්.
2. අනෙකුත් මූල්‍ය ප්‍රකාශන මගින් ලබා ගත නොහැකි මුදල් හා මුදල් සමාන දෑ පිළිබඳ තොරතුරු ලබාගත හැකි වීම.
3. අනාගත මුදල් ප්‍රවාහයක් සම්බන්ධව සැලසුම් සකස් කළ හැකි වීම.
4. එක් එක් ක්‍රියාකාරකම්වල යෙදවී ඇති හා ජනනය වී ඇති මුදල් ප්‍රවාහයන් හඳුනාගත හැකි වීම.

## LKAS **07ට අනුව පවතින නිර්වචන (**Definition)

<u>මුදල් (Cash)</u>

අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත වේ. (මුදල් ශේෂය, ඉල්ලුම් තැන්පතු සුළු මුදල් ශේෂය)

<u>මුදල් හා සමාන දෑ (cash equivalents)</u>

කිසිදු අවදානමකින් තොරව මුදල් බවට පරිවර්තනය කළ හැකි ඉතා ඉහළ ද්‍රවශීලතාවෙන් යුතු කෙටි කාලීන ආයෝජන

eg :- භාණ්ඩාගාර බිල්පත් (මාස 03)

කෙටිකාලීන ස්ථාවර තැන්පතු

<u>මුදල් ප්‍රවාහයන් Cash Flows</u>

මුදල් හා මුදල් සමාන දෑ ව්‍යාපාරය තුළට ගලා ඒම හා ව්‍යාපාරයෙන් පිටතට ගලා යෑම වේ. ව්‍යාපාරයක මුදල් ලැබීම් හා ගෙවීම් ලෙස කොටස් 02කින් යුක්ත ය.

<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් (Operating Activities)</u>

ව්‍යාපාර ආයතනයක ප්‍රධාන ආදායම් ඉපයීමේ ක්‍රියාමාර්ග තුලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ. නැතහොත් ආයෝජන හා මූල්‍ය නොවන ක්‍රියාකාරකම් වේ.

<u>ආයෝජන ක්‍රියාකාරකම් (Investing Activities)</u>

මුදල් හා මුදල් සමාන දෑ යන්නට අයත් නොවන දිගුකාලීන වත්කම් හා වෙනත් ආයෝජනයන් අත්පත් කර ගැනීම් සහ ඉවත් කිරීම්වලට අදාළ ක්‍රියාකාරකම් වේ.

## මූල්‍ය ක්‍රියාකාරකම් (Financing Activities)

ව්‍යාපාරයේ ස්කන්ධ ප්‍රාග්ධනයේ (අයිතිකරුවන්ගේ හිමිකම) සහ ණය ගැනීම්වල ප්‍රමාණයේ හා සංයුතියේ වෙනස්කම් ඇති කරන ක්‍රියාකාරකම් වේ.

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීම (Presentation of a cash flow statement)

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී ක්‍රියාකාරකම් 3ක් යටතේ ඉදිරිපත් කළ යුතුය.

එනම්,

- මෙහෙයුම් ක්‍රියාකාරකම්
- ආයෝජන ක්‍රියාකාරකම්
- මූල්‍ය ක්‍රියාකාරකම්

## **මෙහෙයුම් ක්‍රියාකාරකම්**

ව්‍යාපාරයක ප්‍රධාන ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් මෙහෙයුම් ක්‍රියාකාරකම් ලෙස හඳුන්වයි. මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වන මුදල් ප්‍රවාහය තුළින් බාහිර මූල්‍යයනයකින් තොරව ණය ආපසු ගෙවීමට, ව්‍යාපාරයේ මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට ,ලාභාංශ ගෙවීමට, හා නව ආයෝජනයන් සිදු කිරීමට ඇති හැකියාව තීරණය කෙරේ. සාමාන්‍යයෙන් ව්‍යාපාරයක ශුද්ධ ලාභය හෝ අලාභය තීරණය කරන ගනුදෙනු හා සිද්ධීන්හි ප්‍රතිඵලයක් වශයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් ඇති වේ. මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් අතින මුදල් ප්‍රවාහයන්ට උදාහරණ පහත දැක්වේ.

- භාණ්ඩ විකිණීමෙන් හෝ සේවා සැපයීමෙන් ජනනය වන මුදල්
- පුරස්කාර, කොමිස්, ගාස්තු වශයෙන් ලැබෙන වෙනත් මුදල් ප්‍රවාහ
- භාණ්ඩ හෝ සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්ට ගෙවන මුදල්
- සේවකයන් හට ගෙවන වැටුප් හා අනෙකුත් ගෙවීම්
- රක්ෂණ වාරික ගෙවීම් හා ප්‍රතිලාභ වශයෙන්ලැබෙන මුදල්
- මූල්‍ය හා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනාගත නොහැකි ඕනෑම මුදල් ප්‍රවාහයක්
- වෙළඳ අරමුණු වෙනුවෙන් ඇතුලත්වූ ගිවිසුම් වලින් ලද මුදල් හෝ ගෙවූ මුදල්
- පොලී ගෙවීම්
- බදු ගෙවීම්

## **ආයෝජන ක්‍රියාකාරකම්** (Investing Activities)

මුදල් හා මුදල් සමාන දෑ යන්නට අයත් නොවන දිගුකාලීන වත්කම් හා වෙනත් ආයෝජනයන් අත්පත් කර ගැනීමේ හා ඉවත් කිරීම්වලට අදාල මුදල් ප්‍රවාහයන් ආයෝජන ක්‍රියාකරකම් වේ.

මෙහිදී අනාගත ආදායම් මගින් මුදල් ප්‍රවාහයන් උත්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් වර්තමානයේ දී සම්පත් සඳහා කෙරෙන ආයෝජන තුලින් ආයෝජන ක්‍රියාකාරකම් ජනනය වේ. ආයෝජන ය වෙනුවෙන් ආයතනයක් වෙන් කරන මුදල් ප්‍රමාණය කෙතරම් ප්‍රමාණයක් ද යන්න පිළිබඳව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වෙනම අනාවරණය කිරීම මූල්‍ය වාර්තා පරිශීලනය කරන්නන් හට වැදගත් වේ. මේයින් ව්‍යාපාරයේ අනාගතය පිළිබඳව තොරතුරු ලබාගත හැකිය.

ආයෝජන ක්‍රියාකාරකම් සඳහා උදාහරණ

- දේපල පිරියත හා උපකරණ, අස්පෘෂ්‍ය වත්කම් හා අනෙකුත් දිගුකාලීන වත්කම් අත්පත් කර ගැනීමට හා ඉදි කිරීමට දරනු ලැබූ පිරිවැය, සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රාග්ධනිත කරන ලද පිරිවැය

- දේපල, පිරියත හා උපකරණ , අස්පෘෂ්‍ය වත්කම් සහ අනෙකුත් වත්කම් විකිණීමෙන් ලැබෙන මුදල්.
- වෙනත් ව්‍යාපාරවල ස්කන්ධ හෝ ණය ප්‍රාග්ධනනය තුල කර ඇති ආයෝජන සඳහා ගෙවූ මුදල් හා එකී ආයෝජන විකිණීමෙන් ලැබෙන මුදල් (මුදල් හා මුදල් සමාන දෑ යන්නට අයත් වන කෙටි කාලීන ආයෝජන හැර)
- වෙනත් බාහිර පාර්ශවයන්ට දෙනු ලබන මුදල් අත්තිකාරම් හා ණය
- ආයෝජන ආදායම් ලැබීම් / ලාභාංශ ලැබීම්/ පොලී ගෙවීම්

## <u>මූල්‍ය ක්‍රියාකාරකම් (Financial Activities)</u>

ව්‍යාපාරයක අරමුදල් සම්පාදන මාර්ග හා බැඳුණු මුදල් ප්‍රවාහයන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතට අයත් වේ. මෙහිදී මුදල් සම්පාදනය කර ගැනීමට සඳහා ණය ලබා ගැනීඹ හා කොටස් නිකුත් කිරීම මෙන්ම ගෙවූ ණය පිළිබඳව ද තොරතුරු මූල්‍ය ප්‍රකාශන පිරිශීලකයන්ට ලබාගත හැකි වේ.

මූල්‍ය ක්‍රියාකාරකම්වලට පහත දෑ අතුලත් ය.

- කොටස් නිකුත් කිරීමෙන් ලැබෙන මුදල්
- කොටස් නිදහස් කිරීඹට ගෙවූ මුදල්
- ණයකර නිකුත් කිරීමෙන් හා දිගුකාලීන ණය ලබා ගැනීමෙන් ලද මුදල්
- දිගුකාලීන ණය ආපසු ගෙවීම්
- මූල්‍ය කල්බදු වාරික ගෙවීම්

01. සීමිත සඳුන් පොදු සමාගමේ තොරතුරු පහත දැක්වේ. ඒවා කුමන ක්‍රියාකාරකමට අයත්දැයි X කින් ලකුණු කරන්න.

| මුදල් ප්‍රවාහය | මෙහෙයුම් ක්‍රියාකාරකම් | අයෝජන ක්‍රියාකරකම් | මූල්‍ය ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| ගොඩනැගිල්ලක් මිලදී ගැනීම | | | |
| වැටුප් ගෙවීම | | | |
| බැංකුවෙන් ණයක් ගැනීම | | | |
| පොලී ගෙවීම | | | |
| අත්පිට විකුණුම් | | | |
| ණයගැති ලැබීම් | | | |
| අත්පිට ගැනුම් | | | |
| ණයහිමියන්ට ගෙවීම | | | |
| වියදම් ගෙවීම | | | |
| බැංකු ණය ගෙවීම | | | |
| කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල් | | | |
| ස්ථාවර තැම්පතුවක ආයෝජනය කිරීම | | | |
| මෝටර් රථයක් විකිණීමෙන් ලද මුදල් | | | |
| ආයෝජන ආදායම් ලැබීම් | | | |
| ලාභාංශ ගෙවීම | | | |

## <u>මුදල් ප්‍රවාහ වාර්තා කිරීම (Reporting of Cash flows)</u>

ව්‍යාපාරයක කිසියම් කාලච්ඡේදයකට අදාලව මුදල් ප්‍රවාහයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වාර්තා කිරීමේ දී ප්‍රධාන ක්‍රම 02කට සිදු වේ.

1. සෘජු ක්‍රමය (Direct Method)

මෙම ක්‍රමයේ දී දල මුදල් ලැබීම් හා දල මුදල් ගෙවීම් සියල්ලම අනාවරණය වන පරිදි වාර්තා කරයි. මෙම ක්‍රමය සරල හා පහසුවෙන් අවබෝධ කරගත හැකි ක්‍රමයක් වේ.

2. වක්‍ර ක්‍රමය (Indirect Method)

වක්‍ර ක්‍රමයේ දී වර්ෂයේ ලාභයට හෝ ශුද්ධ ආදායමට මුදල් නොවන ගනුදෙනු, කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම් සහ වෙනත් ක්‍රියාකාරකම්වලට අයත් එහෙත් ලෘභය තුළ අඩංගු අයිතම වෙනුවෙන් ගැලපීම් කර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කරනු ලැබේ. ව්‍යාපාරයේ පවතින සියලුම ක්‍රියාකාරකම් වක්‍ර ක්‍රමයට පිළියෙල කළ නොහැකිය. එය පහත සටහනින් දැක්වේ.

| ක්‍රියාකාරකම | සෘජු ක්‍රමය | වක්‍ර ක්‍රමය |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | ✓ | ✓ |
| ආයෝජන ක්‍රියාකාරකම් | ✓ | x |
| මූල්‍ය ක්‍රියාකාරකම් | ✓ | x |

## වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ වාර්තා කිරීම.

මෙම ක්‍රමයේ දී ශුද්ධ ලාභයට හෝ ශුද්ධ අදායමට ගැලපීම් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලබයි. වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශයක පිළියෙල කළ හැක්කේ මෙහෙයුම් ක්‍රියාකාරකම් පමණි.

අනෙකුත් ක්‍රියාකාරකම් වන ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් පිළියෙල කළ හැක්කේ සෘජු ක්‍රමයට පමණි.

## බදු පෙර ලාභය ගණනය කිරීම

වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශය කරන අවස්ථාවලදී ඇතැම් විට බදු පෙර ලාභය ගණනය කර ගැනීමට සිදු වේ. එවිට එය පහත පරිදි ගැළපිය යුතුය.

| | |
|---|---|
| රඳවාගත් ඉපයීම්වල වෙනස්වීම | xxx |
| + ආදායම් බදු වියදම් | xxx |
| බදු පෙර ලාභය | xxx |

රඳවාගත් ඉපයුම්වල වෙනස ගණනය කිරීමේ දී කාලච්ඡේදයේ සංචිතවලට මාරු කිරීම් හා ගෙවූ ලාභාංශ රඳවාගත් ඉපයුම්වලට එකතු කළ යුතුය.
සීමිත මහවැලි පොදු සමාගමේ තොරතුරු පහත දැක්වේ.

(රු 000)

| විස්තරය | 2021-4-1 දිනට | 2022-3-31 දිනට |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 10000 | 12000 |
| පොදු සංචිතය | 3000 | 3200 |
| රඳවා ගත් ඉපැයුම් | 1600 | 2200 |

- වර්ෂය තුල පොදු සංචිතය භාවිතා කර රු 1000000 ක සංචිත ප්‍රාග්ධනිත කර ඇත.
- කාලච්ඡේදයේ ගෙවූ ලාභාංශ රු 200000 කි

- ආදායම් බදු බදු පෙර ලාභයෙන් 1/3 කි
  බදු පෙර ලාභය ගණනය කරන්න

**විසදුම** **(රු 000)**

| | | |
|---|---|---|
| රදවා ගත් ඉපැයුම් වල වෙනස | 600 | |
| + ගෙවූ ලාභාංශ | 200 | |
| පොදු සංචිතයට මාරු කිරීම | 1 200 | |
| කාලච්ඡේදයේ ලාභාය | 2 000 | |
| + ආදායම් බදු | | |
| $\frac{2000}{2} \times 1 =$ | 1 000 | |
| බදු පෙර ලාභය | | 3 000 |

## කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් ගැලපීම

කාරක ප්‍රාග්ධනය සකස් වනු ලබන්නේ ජංගම වත්කම් හා ජංගම වගකීම් වලිනි. කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් පහත පරිදි ගැලපිය යුතුය.

| අයිතමය | කාලච්ඡේදයේ වෙනස | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීම |
|---|---|---|
| ජංගම වත්කම් | වැඩි වීම | අඩු කරයි (-) |
| | අඩු වීම | එකතු කරයි (+) |
| ජංගම වගකීම් | වැඩි වීම | එකතු කරයි (+) |
| | අඩු වීම | අඩු කරයි (-) |

කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලදී සියලුම ජංගම වත්කම් හා ජංගම වගකීම් තොග ගණනය කරනු ලබයි. වෙනත් අවස්ථාවක මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපීම් කරන අයිතම මෙසේ නොගලපනු ලබයි.

Eg:-

- උපචිත හෝ ඉදිරියට ගෙවූ බදු
- උපචිත පොලිය හෝ ඉදිරියට ගෙවූ පොලිය
- ලාභාංශ
- ලැබිය යුතු ආයෝජන ආදායම් හෝ කලින් ලද ආයෝජන ආදායම්
- ගෙවිය යුතු සේවක පාරිපෝෂිත
- මුදල් හා මුදල් සමාන දෑ